# රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය

# ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනය

## ආයතනික තනතුරු පුරප්පාඩු

රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුර** : **අධ්‍යක්ෂ (පර්යේෂණ) (පුරප්පාඩු 01)**

**මාසික දීමනාව** : **මූලික වැටුප රු.80,295 + ජීවන වියදම් දීමනාව රු.7,800.00 = රු.88,095.00**

**අධ්‍යාපන සුදුසුකම්** : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ජාත්‍යන්තර සබඳතා/සාමය හා ගැටුම් නිරාකරණ අධ්‍යයනය/ ආරක්ෂක අධ්‍යයනය/ බුද්ධි සේවා අධ්‍යයනය/ ත්‍රස්තවාදය/ සමාජ විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ නීතිය/ ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද** : පර්යේෂණ කටයුතු සම්බන්ධව වන ක්ෂේත්‍රයකින් ලබාගත් කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද සහිත වීම.

**වයස** : අවු. 30 ට නොඅඩු විය යුතු අතර අවු. 50 ට නොවැඩි විය යුතුයි. (ද්විතීයන පදනමින් අයදුම්කරන අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.)

**බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා බඳවා ගනු ලැබේ.

- ඉහත තනතුරට අදාලව සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත් **2021.12.17** දින හෝ ඊට ප්‍රථම **ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ.
- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව දන්වමි.

වැඩිදුර විස්තර සඳහා **www.defence.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**ලේකම්,**

**රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**

**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**